# දරිද්‍රතා සංකල්පය ආශ්‍රිත න්‍යායාත්මක විග්‍රහයක්

එස්.එම්. එදිරිසිංහ[1]

**සංක්ෂේපය**

මිනිසා ශිෂ්ටාචාරගත වූ දා සිට ම සමාජය උදෙසා යම් යම් දේ නිපදවන්නට විය. ඒවා සමාජීය නිෂ්පාදනයන් ලෙස හැඳින්විය හැකිය. සෞභාග්‍යය, සශ්‍රීකත්වය, අපරාධ, දරිද්‍රතාවය, මන්දපෝෂණය යනාදිය ඒ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකි ය. මේවායින් සමහරක් සමාජයට හිතකර වන අතර ඇතැම් ඒවා සමාජමය ගැටලු බවට පත් වේ. සමස්ත මානව සමාජය තුළ ම වර්ධනය වෙමින් පවත්නා සමාජමය ගැටලුවක් ලෙස දරිද්‍රතාවය හැඳින්විය හැකිය. දරිද්‍රතාවය වර්තමානයේ ලොව බොහෝ රටවල් මුහුණ දී ඇති බරපතල සමාජ ආර්ථික ගැටලුවකි. දරිද්‍රතාවය යන්න විවිධ ආර්ථික විද්‍යාඥයන්, සමාජ විද්‍යාඥයින් මෙන්ම විවිධ සංවිධාන විවිධාකාරයෙන් නිර්වචනය කර ඇති අතර ඒ ආශ්‍රිත විවිධ සංකල්ප බිහිවී ඇත. වර්තමානය වන විට ශ්‍රී ලංකාව ද මුහුණපා ඇති ප්‍රධාන ගැටලුවක් බවට දරිද්‍රතාවය පත් වී ඇත. මේ හේතු කොට ගෙනම මෙරට ආර්ථිකයේ ගැටලු රැසක් උද්ගතව ඇත. පසුගිය දශක කිහිපය තුළ බලයට පත් වූ රජයන් විසින් දිළිඳුකම තුරන් කිරීමට විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. එම වැඩසටහන් දිළිඳු ජනතාවගේ පරිභෝජනය මෙන්ම නිෂ්පාදනය ද අරමුණු කර ගෙන ක්‍රියාත්මක කරනු ලැබීය. ඒ අතුරින් සමෘද්ධි වැඩසටහන අද දක්වාම ක්‍රියාත්මක වන සුවිශේෂ වැඩසටහනක් වේ. කෙසේ වෙතත් මේ වැඩසටහන් මඟින් දරිද්‍රතාවය මුලිනුපුටා දැමීමක් සිදුනොවූ බව නම් පැහැදිලි ය. මන්දයත් අද වන විටත් සමාජය තුළ දරිද්‍රතාව දැකගත හැකි බැවිනි.

## දරිද්‍රතාව නිර්වචනය කිරීම

ස්වභාවධර්මයෙන් මිනිසාට පනවා ඇති සීමාවන් ජය ගැනීම සංවර්ධනය යි. නමුත් මෙය ලබාගත හැක්කේ මානව ප්‍රජාවගෙන් සුළු කොටසකට පමණි. මේ සංවර්ධනයට හිමිකම් නොකියන කොටස දුප්පතුන් ලෙස වර්ගීකරණය කෙරේ. දිළිඳුබව යනු එක් රටකට පමණක් සීමාවූවක් නොව වත්මන් ලොව බොහෝ රටවල් මුහුණ දී ඇති ගැටලුවකි. 1994 දී එක්සත්ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන පෙන්වා දී ඇත්තේ දිළිඳුකම බලපත්‍රයකින් තොරව දේශසීමා ආක්‍රමණය කරන බවය. දරිද්‍රතාවය යන්න විවිධ සංදර්භයන් තුළ විවිධ ආකාරයෙන් නිර්වචනය කොට ඇති හා තේරුම් ගනු ලැබ ඇති එකක් වන අතර දිළිඳුබවේ මූලික අරුත ගත් කළ එය සාපේක්ෂ වූද පුද්ගල දෘෂ්ටික වූද සංසිද්ධියකි. මේ අනුව ආර්ථික විද්‍යාඥයින් , සමාජ විද්‍යාඥයින් මෙන්ම විවිධ සංවිධාන විසින් දරිද්‍රතාවය විවිධාකාරයට නිර්වචනය කර ඇත.මෙම නිර්වචන දිළිඳුබවේ ස්වභාවය, එහි ලක්ෂණ, දරිද්‍රතාවයට බලපාන හේතු පදනම් කොට ගෙන ඉදිරිපත් කර තිබේ.

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යාව තෙවන වසර, sulochanmadumali1991@gmail.com

ලෝක බැංකුව 2000 වර්ෂය සඳහා නිකුත් කරන සංවර්ධන වාර්තාවෙහි දරිද්‍රතාවය දක්වා ඇත්තේ සුබී භාවයේ විහීනතාවය, ලෙසටය (අතපත්තු, 2011). දරිද්‍රතාව පිළිබඳ වඩාත් ප්‍රචලිත අර්ථ දැක්වීම වනුයේ සමාජය පිළිගත් අවම පෝෂණ මට්ටමක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ආදායම් මට්ටමක් නොපැවතීම යන්නයි (සේමසිංහ,අර්ථ නියාම, 2002).

“Henry Hazlitt, The concept of poverty” ග්‍රන්ථයේ දිළිඳුකම අර්ථ දක්වා ඇත්තේ පුද්ගලයෙකුට අවශ්‍ය අවම අවශ්‍යතා ප්‍රමාණාත්මකව ලබා ගැනීමට නොහැකි මට්ටම දුප්පත්කම ලෙසයි. එසේම 1991 දී The council of European communities නිකුත් කළ වාර්තාවක දුගීභාවය පිළිබඳ ඉදිරිපත් කළ නිර්වචනය වන්නේ තමා ජීවත්වන සමාජය තුළ සමාජය පිලිගත් ආකාරයේ සමාජීය ජීවිතයක් අවම මට්ටමෙන් හෝ පවත්වා ගෙන යාමට නොහැකි අය දුගියන් ලෙස සැලකිය යුතු ය යනුවෙනි (අමරසේකර, 1988).ඩඩ්ලි සියර්ස්ට අනුව ආදායම් විෂමතාවය, විරැකියාව, දරිද්‍රතාවය යන කරුණු තුන අනුව රටක් හෝ ප්‍රදේශයක් දිළිඳු බවට පත් වේ (මාර්ග ප්‍රකාශන, දිළිඳු රටවල් හා ධනවත් රටවල්, 05).

19 වන ශත වර්ෂයේ සිට දුගීකම පිළිබඳ අවධානය වඩාත් යොමු වූ අතර පර්යේෂකයෝ එම සංකල්පය වටහාගැනීමට නොයෙකුත් මිනුම් දඬු භාවිත කළහ. දුගීකම මැනීම සඳහා විවිධ දර්ශකයන් ඉදිරිපත් කරමින් ඕනෑම සමාජයක දුගීකම අවබෝධ කර ගැනීමේ දී ඒවා උපයෝගී කර ගැනීමේ වැදගත්කම අවබෝධ කරලීමට උනන්දු වූ විද්‍යාඥයින් අතර ගුනාර් මිර්ඩාල්ට (Gunner Myrdal) හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මොහු විසින් රචිත Asian Drama නම් කෘතියේ දක්වා ඇති අදහසට අනුව ජනගහනය, සේවාවියුක්තිය, සෞඛ්‍ය තත්ත්වය පිරිහීම, අධ්‍යාපන තත්ත්වය දුර්වලවීම ආදී ප්‍රධාන ජීවන දර්ශකයන් තුළින් දුගීකම අවබෝධ කරගත හැකිය (පෙරේරා, 2006).

"දිනක ආහාර වේලක අඩංගු අවම කැලරි ප්‍රමාණය ලබා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලබන කණ්ඩායම" දරිද්‍රතාවයෙන් පෙලෙන කණ්ඩායම ලෙස ලෝක ආහාර සංවිධානය නිර්වචනය කර ඇත. එමෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය දරිද්‍රතාවය ලෙස සලකන්නේ දිනකට ඇමරිකානු එක්සත්ජනපද ඩොලර් 1 ට වඩා අඩු හෝ දිනකට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 2 ට වඩා අඩු ආදායම් ලබන කණ්ඩායම ලෙසයි (හිදැල්ලආරච්චි, 2007).


රොබට් චේම්බර්ස් දරිද්‍රතාවයේ පැතිකඩවල් 05 ක් ඇති බව පෙන්වාදෙයි.ඒවා නම්,

- ආදායම් දරිද්‍රතාව
- කායික දුබලතාව
- පීඩනයන්ට ගොදුරුවීමේ නැඹුරුතාව
- බල රහිතභාව
- හුදෙකලාවීම යනාදිය යි.

මෙකී පැතිකඩවල් එකිනෙකට ස්වාධීනව ත් එකිනෙක හා සම්බන්ධ වීමෙනු ත් පුද්ගලයන් හා කුටුම්භ දිළිඳුකමෙහි රඳවා තබයි. මෙම අංශ අන්‍යෝන්‍ය වශයෙන්

එකිනෙක කෙරෙහි බලපාමින් දරිද්‍රතාවය තව තවත් තීව්‍ර කෙරෙමින් දිළින්දන් විහීනතා පාෂයකට හසු කර ගෙන ඇත.පහත රූපසටහනින් එය පැහැදිලි වේ (අතපත්තු, 2011).

රූප සටහන් අංකය 1.1:විහීනතාපාශය




මූලාශ්‍රයඃආර්ථික විද්‍යා ප්‍රවේශය 2

**දරිද්‍රතාවයේ විවිධ ප්‍රභේද**

දරිද්‍රතා සංකල්පය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය.එනම්,

- සාපේක්ෂ දිළිඳුකම
- නිරපේක්ෂ දිළිඳුකම යනුවෙනි.

මීට අමතරව දිළිඳුකමේ තවත් අංශ කිහිපයක් හඳුනාගත හැකිය.එනම් සමාජයීය දිළිඳුකම, ආධ්‍යාත්මික දිළිඳුකම, හුදු දිළිඳුකම හා විෂයබද්ධ දිළිඳුකම යනුවෙනි.

- සාපේක්ෂ දිළිඳුකම

සාපේක්ෂ දරිද්‍රතාවය ඍජුවම හඳුනාගත නොහැකි සංකල්පයකි. ලෝක බැංකුව නිර්වචනය කරන්නේ කිසියම් රටක මධ්‍යම ආදායම් මට්ටමට සාපේක්ෂව එක් එක් පුද්ගලයන් හෝ කුටුම්භ හෝ හිමිකරගන්නා ආදායම් මට්ටම් තුලනාත්මකව විග්‍රහ කිරීමය(අතපත්තු,2011,451). යම්කිසි සමාජයක වෙසෙන ජනතාව විසින් තීරණය කරනුලබන හෝ පිළිගනුලබන ජීවනමට්ටම හෝ ජීවනරටාවට අනුකූලව දුගීකම

පිළිබඳ නිර්ණායකයන් වෙනස්විය හැකි ය. යම්කිසි කාලයක දී හෝ ස්ථානයකදී දුගීකම වශයෙන් පිළිගන්නා වූ ජීවන මට්ටම් තවත් ස්ථානයකදී හෝ කාල වකවානුවක දී වෙනස්විය හැකි බව සාපේක්ෂ දුගීකම පිළිබඳ න්‍යායෙන් විග්‍රහ කරයි (පෙරේරා, 2006,05).

- නිරපේක්ෂ දිළිඳුකම

නිරපේක්ෂ දිළිඳුකම අපට සෘජුවම හඳුනාගත හැකිය.එනම් රැකියාවක් හෝ ආදායම් මගක් නොවීම, පෝෂ්‍යදායක ආහාර නොලැබීම, ජීවත්වීමට ස්ථිර තැනක් නොවීම ආදියයි (අමරසේකර,1988,128).සෞඛ්‍යය හා ශාරීරික වශයෙන් කාර්යක්ෂම භාවය රඳාපැවැත්ම සඳහා අවශ්‍ය නොයෙකුත් මූලික මානව අවශ්‍යතාවයන් ඇසුරින් ගොඩනගා ඇති සංකල්පයකි. යැපුම් මට්ටමේ ආර්ථික ස්වභාවයට වඩා අවම මට්ටමක් දුගීකම මැනීමේ දර්ශකයක් වශයෙන් මෙම සංකල්පය තුලින් විග්‍රහ කරනු ලබයි (පෙරේරා,2006,03).

- සමාජයීය දිළිඳුකම

ආර්ථික වශයෙන් අසමානකම් පදනම් කරගෙන ඒ තුළින් පැනනැගෙන පහත් ආදායම හා පහත් ජීවන මට්ටම තුළින් සමාජයීය දිළිඳුකම ඇති වේ. එමෙන්ම සමාජයීය දිළිඳුකම පන්ති ක්‍රමයක් මත ගොඩනැගුන සමාජයක පැහැදිලිව ම දැකගත හැකිය.

- ආධ්‍යාත්මික දිළිඳුකම

ආධ්‍යාත්මික සුවයපතා සිය කැමැත්තෙන් ම දිළිඳුකම වැලඳගත් අය ආධ්‍යාත්මික දිළින්ඳන් ලෙස හඳුනාගත හැකි ය.

- හුදු දිළිඳුකම

කිසිවකුගේ හෝ සහයක් නොමැතිව ජීවත්වීමට නොහැකි ව, ජීවත් වීමට නොහැකි වූ අය මේ යටතට ගැනේ.


- විෂයබද්ධ දිළිඳුකම

ලෝකයේ පවත්නා සමාජ මට්ටම් එක සමාන නොවන බැවින් එකම සමාජයක වුවද දුගීකම පිළිබඳ දකින සිතන අගයන ආකාරය වෙනස්වන අතර එය විෂයබද්ධ දිළිඳුකම තුළින් හඳුනාගත හැකි ය.

**දිළිඳුබවේ විෂම චක්‍රය**

දිළිඳුබවේ විෂම චක්‍රය දිළිඳුකම පිළිබඳව කතා කිරීමේදී වැදගත්වන තවත් සංකල්පයකි.මෙය රැග්නාර් නර්ක්ස් නම් අර්ථ ශාස්ත්‍රඥයා විසින් ඉදිරිපත්කර ඇත්තේ එකිනෙකට වෙනස් වූ ප්‍රභේදනයන් කීපයක විලාසයෙනි (අමරසේකර, 1988)

රූපසටහන් අංකය 1.2




මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා සමාජය

දිළිඳුබව නැති කිරීමට නම් මෙම චක්‍රය බිඳදැමිය යුතු ය.එය ආරම්භ කළ යුත්තේ වඩාත් පහසු ස්ථානයකිනි.

**දරිද්‍රතාව යන්නෙහි අන්තර්ගත ලක්‍ෂණ**

- ප්‍රමාණවත් ආහාර නොතිබීම
- ඉහළ ළදරු මරණ අනුපාතිකය
- අඩු ජීවිත අපේක්‍ෂාව
- අඩු අධ්‍යාපන අවස්ථා
- පිරිසිදු පානීය ජලය නොතිබීම
- සෞඛ්‍ය පහසුකම් මදකම
- අයහපත් නිවාස
- තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි සක්‍රීය සහභාගිත්වයක් නොමැතිකම යනාදිය දැක්විය හැකි ය (දිසානායක, 1998).

**දරිද්‍රතාව මිනුම් කිරීම**

දුගීකම මිනුම් කිරීම සඳහා භාවිත කරන ජීවන දර්ශකයන් කීපයකි.

- දළ ජාතික නිෂ්පාදනය
- ජීවන දර්ශකයන්ගේ භෞතික ගුණාංග

එනම් ප්‍රජාවගේ සෞඛ්‍යය හා සුභසාධනය ,ආයු කාලය ,ළමා මරණ හා මාතෘ මරණ, ලිවීමේ හා කියවීමේ හැකියාව යි.

- මූලික අවශ්‍යතා පිළිබඳ එළඹුම

ආහාර, ජලය, ආරක්ෂාව, ජීවත් වීමට සුදුසු නිවාස, මාර්ග හා ප්‍රවාහන පහසුකම්, සෞඛ්‍ය තත්ත්වය ආදිය සලකාබලනු ලැබේ (පෙරේරා, 2006)

මීට අමතරව දරිද්‍රතාවය මැනීමට යොදාගන්නා තවත් දර්ශකයකි, මානව දරිද්‍රතා දර්ශකය.මෙය සංවර්ධිත රටවලට හා සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වෙනවෙනම ගණනය කරයි. තව ද 2010 දී ඔක්ස්ෆර්ඩ් සරසවිය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ඒකාබද්ධ වී බහුමාන දරිද්‍රතා දර්ශකය නමින් නව දර්ශකයක් ගොඩනංවා ඇත. එය 2010 මානව සංවර්ධන වාර්තාව මඟින් ප්‍රථම වරට එළිදක්වනු ලැබී ය.(අතපත්තු,2011,456)වත්මන් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මිනුම් කරනුයේ නිල දරිද්‍රතා රේඛාව පදනම් කරගෙන ය.

මේ කෙසේ වුව ද දරිද්‍රතාවය හඳුනා ගැනීමට භාවිත කරන නිර්ණායක රටකින් රටකට, ප්‍රදේශයකින් ප්‍රදේශයකට වෙනස්විය හැකි ය. එමෙන්ම සෑම රටකටම පොදු වූ ප්‍රශ්නයක් ලෙස දරිද්‍රතාවය හඳුනාගත හැකි ය.

**ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය**

ශ්‍රී ලංකාව තවමත් හඳුනාගනු ලබන්නේ සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙසය.සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය වන්නේ දරිද්‍රතාවයයි.ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය කෙරෙහි බලපා ඇති ප්‍රධාන සාධක ශීර්ෂ 03 ක් යටතේ වර්ග කළ හැකි ය. එනම්,

- අවකාශීය හෝ ස්ථාන කේන්ද්‍රීය කරුණු

මේ යටතේ භූගෝලීය පිහිටීම,ස්වභාවික විපත් ආදිය සලකා බැලේ.

- ආංශික ලක්ෂණ

මේ යටතේ විවිධ අංශයන් හි පවතින පසුගාමී තත්ත්වයන් සලකා බැලේ.උදාහරණ ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රය අධ්‍යාපන ක්ෂේත්‍රය සලකා බැලේ.

- පුද්ගල බද්ධ හා කුටුම්භබද්ධ සාධක

මේ යටතේ කුටුම්භයේ විශාලත්වය, වයස්ව්‍යුහය, ස්ත්‍රී පුරුෂ භාවය යනාදිය සලකා බැලේ.

ආංශික වශයෙන් ජනගහන ව්‍යාප්තිය සහ සේවා නියුක්ති ව්‍යුහය අනුව ශ්‍රී ලංකාව පැහැදිලිවම ග්‍රාමීය ජන සමාජයකි. ශ්‍රී ලාංකික තත්කාලීන ආර්ථිකයේ ග්‍රාමීය අංශයේ වැදගත්කම අංශ රාශියකින් පෙන්නුම් කරනු ලැබේ. ප්‍රථමයෙන් ම එය ජාතික ආහාර සැපයුමේ ප්‍රධාන මූලය වෙයි. ජනගහනයේ මූලික අවශ්‍යතා ඉටු කිරීම පිණිස ප්‍රධාන ආහාරය සහ වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන ග්‍රාමීය අංශය විසින් නිෂ්පාදනය කරනු ලැබේ. වැවිලි අංශයේ ප්‍රගතිය සමඟ යටත් විජිත පාලකයෝ සාම්ප්‍රදායික කෘෂිකාර්මික ග්‍රාමීය අංශය නොසලකා හැරියහ. එහි

ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය ආර්ථිකය සම්බන්ධයෙන් විරැකියාව, ඌන සේවානියුක්තිය, ඉඩම් අහිමි බව, පහළ ආදායම් මට්ටම සහ පහළ ජීවන තත්ත්වය වැනි ප්‍රධාන ගැටලු නිසා දරිද්‍රතාවය ඉහළ ගියේ ය.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මැනීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2002 දී පවත්වන ලද ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයෙහි දත්ත පදනම් කර පිහිටුවන ලද දරිද්‍රතා රේඛාව ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව ලෙස 2004 ජුනි මස පිළිගැණුනි. මේ අනුව 2009/10 සමීක්ෂණ කාලය සඳහා නිල දරිද්‍රතා රේඛාවේ අගය මාසික මූර්ත ඒක පුද්ගල මුළු පරිභෝජන වියදම රු.3028 ක් විය (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව).

ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයෙහි ප්‍රතිඵල පදනම් කර ගනිමින් දිළිඳුකම මැනීම සඳහා පොදු දර්ශකයක් ලෙස භාවිතා කරන ජනගහන දරිද්‍රතා දර්ශකය,2009/10 වසරේ වාර්තා වූ සියයට 8.9 ට සාපේක්ෂව 2012/13 වසරේදී සියයට 6.7ක් ලෙස වාර්තා වී ඇත. ජනගහන දරිද්‍රතා දර්ශකය අනුව දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනගහනය 2009/10 වසරේදී වාර්තා වූ මිලියන 1.8 ට සාප්ක්ෂව 2012/13 වසරේ දී ආසන්න වශයෙන් මිලියන 1.3 ක් විය (මහ බැංකු වාර්තාව,2015).මෙසේ දරිද්‍රතාවය පහළ යාමට හේතු වී ඇත්තේ දරිද්‍රතාවය පිටුදැකීමට සෑම රජයක් ම ගන්නා උත්සාහයන් යැයි සිතිය හැකි ය.

**ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීමට දරන ලද ප්‍රයත්නයන්**

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීමේ මූලික ප්‍රතිපත්ති සකස් වන්නේ යටත් විජිත පාලන කාලය තුළ ය.ඒ අතරින් බ්‍රිතාන්‍ය පාලන සමය විශේෂ වේ. වත්මන වන විටත් විවිධ සහනාධාර ක්‍රම හඳුන්වා දෙනු ලබන්නේ බ්‍රිතාන්‍යයන් විසිනි. 1948 නිදහසින් පසුව දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් වල පුනරුදයක් දැකගත හැකි ය. ශ්‍රී ලංකාවේ මෙතෙක් බලයට පත් සෑම රජයක් විසින් ම දරිද්‍රතාවය පිටුදැකීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. මෙම වැඩසටහන් තුළින් භූගෝලීය අසමානතාවයන් මෙන්ම සමාජ ආර්ථික අසමානතාවයන් තුරන් කරමින් නාගරික හා ග්‍රාමීය සංවර්ධනය ඇති කිරීමට උත්සහ දරා ඇත. දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් වල ස්වරූපය අනුව මෙම වැඩසටහන් කොටස් 02 ක් යටතේ හඳුනා ගත හැකි ය. එනම්,

- පරිභෝජනය මුල් කරගත් වැඩසටහන්
- පරිභෝජනය සහ නිෂ්පාදනය මුල් කරගත් වැඩසටහන් යනුවෙනි.

**පරිභෝජනය මුල් කරගත් වැඩසටහන්**

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් අතර පරිභෝජනය මුල් කරගත් වැඩසටහන් ප්‍රධාන විය. එම පරිභෝජනය මුල් කරගත් වැඩසටහන් අතර,

- ආහාර සහනාධාර හා ආහාර මුද්දර ක්‍රමය

- දරුවන්ට,ගැබිණි හා කිරිමව්වරුන්ට කිරි සහ පෝෂණ ද්‍රව්‍ය ලබාදීම
- පාසල් දිවා ආහාර වැඩසටහන් වැදගත් වේ (හඳරාගම හා රස්නායක, 2011)

**පරිභෝජනය සහ නිෂ්පාදනය මුල් කරගත් වැඩසටහන්**

දිවයින යටත් විජිතයක් වශයෙන් පැවති අවධියේ සිටම ලංකාවේ නිෂ්පාදනය අරමුණු කරගත් දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන් හඳුනාගත හැකිය. මෙම වැඩසටහන් තුළින් ප්‍රජාවගේ පරිභෝජන අවශ්‍යතා සම්පූර්ණ කරන අතරම රටේ නිෂ්පාදනය සඳහා ද ඔවුන්ගේ දායකත්වය සක්‍රීය ලෙස ලබා ගැනීම අපේක්ෂා කෙරේ. එම වැඩසටහන් අතර,

- ගොවිජනපද ව්‍යාපාරය
- කෘෂිකර්මය නවීකරණය කිරීම
- ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති
- අඳ ගොවි ප්‍රතිසංස්කරණ
- බහුකාර්ය ගංගා නිම්න සංවර්ධන යෝජනා ක්‍රමය
- ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති
- ජනසවිය වැඩසටහන
- සමෘද්ධි ව්‍යාපාරය යන වැඩසටහන් වැදගත් වේ(හඳරාගම හා රස්නායක, 2011).

මෙම වැඩසටහන් මෙන්ම ගම නැගුම, මග නැගුම, ගැමිපුබුදුව, ආදී සූක්ෂම මට්ටමේ වැඩසටහන් ද කැපීපෙනෙන වැදගත්කමක් ගනී(හඳරාගම හා රස්නායක, 2011). මෙම වැඩසටහන් අතරින් ජනසවිය වැඩසටහන හා සමෘද්ධි වැඩසටහන විශේෂ වේ.

1989 වර්ෂයේ ඉදිරිපත් කළ ජනසවිය වැඩසටහන වැදගත් වන්නේ,

- එය නිෂ්පාදනය ඉලක්ක කරගත් ව්‍යාපෘතියක් වීම.
- දිළිඳු ප්‍රජාවේ හැකියාවන් වර්ධනය කරගැනීම සඳහා ව්‍යාපෘතිය තුළ වැඩි ඉඩක් ලබාදීම.
- ඉතිරිකිරීම් සම්බන්ධව බිම් මට්ටමින් සමාජය තුළ ඇති කළ මතවාදය හා පුරුද්ද යනාදිය නිසා ය.

මෙම වැඩසටහනේ සංවිධාන ව්‍යුහයේ දක්නට ලැබුණු ගැටලු මෙන්ම දේශපාලන ගැටළු ද මෙම ව්‍යාපෘතිය අඩපණ වීමට ප්‍රධාන වශයෙන් බලපෑවේ ය (හඳරාගම හා රස්නායක, 2011).

ශ්‍රී ලංකාවේ වත්මන් ජාතික වැඩසටහන වන සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කරනු ලැබුවේ 1995 වසරේදී ය. සමෘද්ධි ව්‍යාපාරයේ මූලික සංකල්පය වූයේ පවුල් ඒකකයෙන් ආරම්භ කොට ජාතික මට්ටමෙන් දිළිඳුකම පිටුදැකීමයි. මෙය සුභසාධන ප්‍රවේශය ග්‍රාම සංවර්ධන ප්‍රවේශය හා සමෘද්ධි බැංකු සංගම් ප්‍රවේශය යන ප්‍රධාන

සංවර්ධන ප්‍රවේශ 3 න් සමන්විත වේ (සේමසිංහ, 2002). සමෘද්ධි වැඩසටහනේ වැදගත්කම පෙන්වන සාධක අතර,

- ඉතිරි කිරීම සම්බන්ධයෙන් ඇති කළ පුරුද්ද
- තරුණ සහ කාන්තා ශ්‍රම දායකත්වය ඉලක්ක කිරීම
- සංවිධාන පරිපාලන ව්‍යුහය විධිමත් වීම
- ණය පිළිබඳ සංස්කෘතියක් ඇති කිරීම
- සාමූහිකත්වය පිළිබඳ ඇති කළ පුරුද්ද
- පරිභෝජනය හා නිෂ්පාදනය ඉලක්ක කරගත් ව්‍යාපෘතියක් වීම
- වෙළෙඳපොළ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට මැදිහත්වීම
- සමාජ ආරක්ෂණය සහතික කිරීම යනාදිය වැදගත් වේ (හඳරාගම හා රස්නායක, 2011).

නමුත් මෙම වැඩසටහනේ දුර්වලතා කිහිපයක් ද පවතී. මූලික අරමුණ වූ දරිද්‍රතාවය අවම කිරීමේ ප්‍රයත්නය සාධනීය ලෙස ඉටු කර ගැනීමට නොහැකි වීම මෙන්ම දේශපාලන මැදිහත්වීම වැඩිවීම, යම් යම් හේතුන් මත සහනාධාර නොලැබිය යුතු පුද්ගලයන් ඊට ඇතුලත් ව තිබීමත් සහනාධාර ලැබිය යුතු පුද්ගලයන් ඉන් බැහැරව සිටීම යනාදිය මෙම වැඩසටහනේ දුර්වලතා කිහිපයක් ලෙස දැක්විය හැකි ය. වර්තමානයේ මෙය දිවි නැගුම නමින් ක්‍රියාත්මක වන්නේ මෙම වැඩසටහනයි.

**සමාලෝචනය**

දරිද්‍රතාව විවිධ සංදර්භයන් තුළ විවිධාකාරයෙන් නිර්වචනය කොට ඇති හා තේරුම් ගනු ලැබ ඇති එකක් වන අතර දිළිඳුබවේ මූලික අරුත ගත්කළ එය සාපේක්ෂ වූද පුද්ගල දෘෂ්ටික වූද සංසිද්ධියක් බව උක්ත කරුණු අනුව පැහැදිලි වේ. මේ නිසා ම දිළිඳු බව හඳුනා ගැනීමට හා විග්‍රහ කිරීමට විවිධ නිර්නායක භාවිත කරයි.මේ හේතුකොටගෙන දිළිඳුබව ආශ්‍රිත විවිධ සංකල්පබිහිව ඇත. සංවර්ධනය වෙමින් පවත්නාරටක් ලෙස ලංකාවේ දැකිය හැකි ප්‍රධානත ම ගැටළුවකි, දරිද්‍රතාව. ඒ සඳහා මෙතෙක් පැවති සෑම රජයක් ම විවිධ උපාය මාර්ග අනුගමනය කොට ඇත. එම වැඩසටහන් අංශ කිහිපයක අරමුණු ඉටු වුව ද සමස්තයක් ලෙස දරිද්‍රතාව පිටුදැකීමට නොහැකි වී ඇති බව අවසානයේ නිගමනය කළ හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අතපත්තු ඩැනී, 2011, ආර්ථික විද්‍යා ප්‍රවේශය 2, කතෘ ප්‍රකාශන

සේමසිංහ ඩබ්.එම්,2002,විදහසින් පසු දරිද්‍රතාවයපිටුදැකීම අරමුණු කරගත් ශ්‍රී ලංකාවේ උපාය මාර්ග,අර්ථ නියාම, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය, 2 වෙළුම

අමරසේකර දයා,1988, ශ්‍රී ලංකා සමාජය, ආරියප්‍රකාශකයෝ, බෞද්ධ විද්‍යාල මාවත, වරකපොළ

මාර්ග ප්‍රකාශන, දිළිඳු රටවල් හා ධනවත් රටවල්,

ආර්ථිකවිද්‍යා
2016

පෙරේරා ස්වර්ණලතා,2006, සමාජ ගැටලු, වින්දනප්‍රකාශකයෝ, අංක27/3,පැඟිරිවත්ත පටුමඟ, සෝමා තලගල මාවත, ගංගොඩවිල, නුගේගොඩ

හිදැල්ලආරච්චි සී.සී,2007,සංවර්ධන අධ්‍යයනය

දිසානායකආරියවංශ, 1988, දරිද්‍රතාවය පිළිබඳ න්‍යායික විග්‍රහයක්, ආර්ථික විමර්ශන,කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය, 2 වෙළුම

හඳරාගමසමන් හා රස්නායක සුසන්ත,2011,සංවර්ධන සමාජ විද්‍යාව,සමීර ප්‍රකාශන,12,පොල්දූව,බත්තරමුල්ල